**මීරිගම ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මීරිගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** මූල්‍ය **ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රමිතයේ පරිච්ඡේද 2.5 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවත්, පෙර වර්ෂයන් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු උසාවි දඩ සහ මුද්දර ගාස්තු වටිනාකම රු.93,393,701 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතය ප්‍රකාරව නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ක්‍රියාත්මක කර නොමැති රු.200,000ක සහා අරමුදල් ව්‍යාපෘතියකට සහ 2017 වර්ෂයේ මුදල් ලැබී ගෙවීම් කරන ලද රු.573,628ක ව්‍යාපෘතියකට අදාලව එකතුව රු.773,628 ක් කර්මාන්ත ණයගැතියන් ලෙස ගිණුම් ගතකර තිබුණි. | 2024 ගිණුමෙන් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශය අනුව ලැබිය යුතු වරිපනම් ඊට අදාල කාල විශ්ලේෂණය සමඟ සැසඳීමේදී රු.49,316 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම. | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වගන්තිය | 2009 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | 2023 වර්ෂයේ දී නව තක්සේරුවක් කර ඇති බව. | නව වරිපනම් රේට අනුව වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 1991 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පැවති, නොපියවූ අත්තිකාරම් ශේෂ 24 ක වටිනාකම රු.5,407,708 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පියවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව. | මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක LGD/13/2016(i) හා 2020 දෙසැම්බර් 03 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර) චක්‍රලේඛය | කඩ කාමර 02 ක් අතුරු බදු දීමේදී කටයුතු කර නොතිබුණි. | කඩ කාමරයක බදු අයිතිය පැවරීම කරමින් පවතින අතර, කඩ කාමරයක පෙර මුදල් ගෙවා නොමැති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.34,416,743 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 62,390,419 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,018,493 | 9,641,896 | 9,641,896 | 7,129,899 | 14,817,700 | 12,178,416 | 13,073,421 | 7,327,151 |
| (ii) | කුලී | 30,101,325 | 33,903,698 | 33,903,698 | 6,032,943 | 38,066,600 | 29,586,530 | 33,614,763 | 5,061,651 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,150,000 | 1,770,900 | 1,770,900 | 59,725 | 2,150,000 | 1,640,045 | 1,640,045 | 59,725 |
| (iv) | වෙනත් ආදායම් | 224,187711 | 240,904,080 | 240,922,717 | 346,232 | 205,557,000 | 251,372,651 | 240,124,295 | 10,308,076 |
| | | 271,457,529 | 286,220,574 | 286,239,211 | 13,568,799 | 260,591,300 | 294,777,642 | 288,452,524 | 22,756,603 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | කාල විශ්ලේෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය, වසර 10 ට වැඩි රු.637,158 ක්ද, වසර 5 ක සිට වසර 10 ක් අතර රු.3,277,459 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර රු. 594,253 ක්ද, වසර 1 ක සිට වසර 3 ක් අතර රු.1,059,329 ක්ද, වසර 1ට අඩු රු1,410,173 ක් ද වූ අතර මුළු හිඟයෙන් සියයට 55 ක් එක් උප කාර්යාලයකට අයත්ව තිබුණි. | වරිපනම් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.7,244,396 ක්වූ හිඟ වරිපනම් ශේෂයෙන් අයකිරීම් රු.1,978,834 ක් වූයෙන් අයවීම් ප්‍රතිශතය සියයට 27 ක්ද, සමාලෝචිත වර්ෂයට අදාලව බිල්කළ වටිනාකම රු.6,029,825 කින් අයකිරීම් රු.4,182,446 ක් වූයෙන් අයවීම් ප්‍රතිශතය සියයට 69 ක්ද වී තිබුණි. | එම | හිඟහිටි වරිපනම් බදු හා ප්‍රවර්ථන වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති අක්කර බදු ශේෂය රු.38,426 කින් වර්ෂය තුල අයකරගත් වටිනාකම රු.3,070 ක් වූයෙන් අයකිරීම් ප්‍රතිශතය සියයට 8 ක් ද, වර්ෂයට අදාළ වටිනාකම රු.40,440 ක් සහ අයකරගත් වටිනාකම රු.12,131 ක් වීමෙන් අයකිරීම් ප්‍රතිශතය සියයට 30 ක්ද වී තිබුණි. | 2024 වර්ෂය තුල සමීක්ෂණයක් කිරීමට කටයුතු කරන බව. | හිඟ අක්කර බදු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | හිඟ කර්මාන්ත බදු ශේෂය රු.44,330 ක් වසර 10 ට වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | කපාහැරීමට අනුමැතියට යොමු කර ඇති බව. | හිඟහිටි කර්මාන්ත බදු අයකළ යුතුය. |

(ආ) **කුලී**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ කඩ කුලී ශේෂය, වසර 5 ක සිට වසර 10 ක් අතර රු.33,000 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර රු.217,500 ක්ද, වසර 1 ක සිට වසර 3 ක් අතර රු.1,563,650 ක්ද, වසර 1ට අඩු රු.3,479,275ක්ද වී තිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අයකළ යුතුය. |
| (ii) | හිඟ මස්කඩ හා මාළු කඩ ටෙන්ඩර් කුලී ශේෂය රු.262,084 ක් වසර 3ත් 5 ත් අතර කාලයක සිට පැවතුණි. | එම | එම |

(ඇ) **බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| 2010 සහ 2011 වර්ෂවල සිට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ශේෂය රු.59,725 ක් අයකර නොතිබුණි. | කපාහැරීමට අනුමැතියට යවා ඇති බව. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඈ) **වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| 2019 වර්ෂයේ කුලියට දී තිබූ කඩ කාමර 31 ක් ව්‍යාපාර කටයුතු කරමින් පැවතුණද, පෙර මුදල් අයකර ගිවිසුම්ගත වීමෙන් පසුව කඩ කාමරවල යතුරු ලබා නොදීම හේතුවෙන්, හිඟ පෙර මුදල් ශේෂය රු.41,510,174 ක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. | ගිවිසුම් ගත වීමට සහ පෙර මුදල් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අයකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට්පත්‍රය අනුව, සභාව මගින් පවත්වාගෙන යන ආදාහනාගාරය සම්බන්ධයෙන් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | ලබාගැනීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍රයක් ලබාගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කර්මාන්ත ණයගැති ශේෂය, වසර 5 ත් 10 ත් අතර රු.3,241,131 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.2,627,571 ක්ද, වසර 1 ත් 3 ත් අතර රු.631,026 ක්ද වී තිබුණි. | තීරණ කමිටුවේ තීරණය ලබාගෙන කටයුතු කරන බව. | ණයගැති ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ආ) | කර්මාන්ත ණයහිමි ශේෂය, වසර 5 ත් 10 ත් අතර රු.1,459,352 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.4,917,440 ක්ද, වසර 1 ත් 3 ත් අතර රු.850,129 ක්ද, වී තිබුණි. | එම | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නව වෙළඳපොල සාප්පු සංකීර්ණය සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී, නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ. | | |
| i. | කඩ කාමර 4 ක සභාවේ අනුමැතියකින් තොරව වර්ග අඩි 9,186 කින් ප්‍රමාණය වැඩි කරගෙන තිබුණි. | අනුමැතියකින් තොර අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙස දන්වා යැවීමට කටයුතු කරන බව. | අනුමැතියෙන් තොර අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුය. |
| ii. | කඩ කාමරයක වැඩිවූ වර්ග අඩි ප්‍රමාණය සඳහා රු.1,672,270 ක් අයකර තිබුණු නමුත්, ගිවිසුම සංශෝධනය කර නොතිබුණි. | බදුකරු සමඟ නැවත ගිවිසුම් ගත වීමට කටයුතු කරමින් පවතින බව. | වැඩිවූ වර්ග අඩි ප්‍රමාණයට ගිවිසුම සංශෝධනය කළ යුතුය. |
| iii. | කඩ කාමර 5 ක ගිවිසුම් අවසන් වී ඇතත් ගිවිසුම් ගතවී නොතිබුණි. | නව තක්සේරුව අනුව ගිවිසුම්ගත වන බව. | ගිවිසුම්ගත විය යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය, විශ්‍රාමගිය, සේවය අතහැර ගිය සේවකයින් 4 දෙනෙකුගේ ණය හා අත්තිකාරම් ශේෂය රු. 457,222 ක් 2024 මාර්තු 31 දින වන විට අයකර ගැනීමට පැවතුණි. | සේවක ණය අයකරගැනීමට කටයුතු කරන බව. | සේවක ණය අය කළ යුතුය. |